# භාෂාව මානව පාලනයෙන් පරිබාහිර සංසිද්ධියක් ලෙස ගැනෙන ඩෙරීඩියානු දෘෂ්ටියෙහි යුක්තිසාධනීයභාවය සම්බන්ධ ගැටලුව පිළිබඳ බෞද්ධ දාර්ශනික විමර්ශනයක්

එස්. එම්. චතුරි ගවේෂිකා සමරකෝන්[1]

## හැඳින්වීම

සමකාලීන මහද්වීපික දර්ශනයෙහි එන භාෂාව හා සම්බන්ධ ප්‍රබල දාර්ශනිකයෙකු ලෙස ජැක් ඩෙරීඩා (1930-2004)පෙන්වාදිය හැකිය. ඔහුගේ භාෂාව හා සම්බන්ධ විග්‍රහයන්හි ඇති විප්ලවීය ස්වරූපය හේතුවෙන් භාෂාව හා සම්බන්ධ පශ්චාත් ව්‍යුහවාදී දෘෂ්ටියෙහි කේන්ද්‍රීය දාර්ශනිකයෙකු සේ සලකනු ලැබේ.

## විධික්‍රමවේදය

මෙම පර්යේෂණය ඔහුගේ එවැනි විප්ලවීය සංකල්පයක් පිළිබඳව ප්‍රපංචවිද්‍යාත්මක විධික්‍රමවේදය හරහා විචාරයක් ඉදිරිපත් කිරීමකි.

## දත්ත සහ සාකච්ඡාව

භාෂාව හා සම්බන්ධ ඩෙරීඩියානු අදහස් ඉදිරිපත් වන්නේ ජර්මානු දාර්ශනික එඩ්මන්ඩ් හුසල් විසින් භාෂාව හා සම්බන්ධව ඉදිරිපත් කරන ලද ප්‍රපංචවිද්‍යාත්මක අදහස්වලට ප්‍රතිවිරෝධී ලෙසය. (Harland;1987; 125) . හුසල් ඉදිරිපත් කරන ලද ප්‍රපංචවේදය තුළ මූලික සංකල්පයක් වූ 'චේතනාභිරෝපණය'(Intentionality) නමැති සංකල්පය ඔහුගේ භාෂාව හා සම්බන්ධ ස්ථාවරයටද සෘජුවම සම්බන්ධ වේ. ඒ පිළිබඳ සරලවවිග්‍රහ කළහොත්, හුසල් විසින් කථනය මූලික භාෂා ක්‍රියාකාරකම ලෙස සලකන ලදී. පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිපදෙනෙකු අතර ඇතිවන සංවාදයේදී කථකයා විසින් මානසිකව කිසියම් වචනයකින් අර්ථවත් කිරීමට උත්සාහදරන අදහස ඒ අයුරින්ම වටහාගැනීම ශ්‍රාවකයා විසින් සිදු කළයුතුය. එවිට නියමාකාර භාෂා සන්නිවේදනයක් සිදු වන බවත් හුසල් පැවසීය.ඒ සඳහා සංඥාකාරකයන් සහ සංඥිතයන් උපකාරී වේ. නමුත්, හුසල් මෙම දෙදෙනෙකු අතර ඇතිවන සාකච්ඡාව කිසියම් ද්වීතීයික මට්ටමකට ගෙන එයි. ඒ අනුව නියම සන්නිවේදනය සිදුවන්නේ අභ්‍යන්තර භාෂණය (Interior Monologue) තුළ යැයි ඔහු පවසයි. එනම් තමන්ට තමන් කථා කිරීමකි. නමුත් මෙහිදී හුසල් කිසියම් විරුද්ධාභාසයකට යොමු වන බව පෙනේ. එනම් පුද්ගලයෙකු කථාකිරීමට පෙරම තමා අදහස් කරන දෙය දනී. එවිට භාෂාව කිසියම් පැලැස්තරයක තත්වයට පත්වේ. හුසල්ට අනුව භාෂාව අර්ථවත් වන්නේ මානව විඥානයේ මැදිහත්වීමෙනි. (Derrida; David B. Allison; Newton Garver(tr.);1973; 67 -69) ඩෙරීඩා විසින් විවේචනය කරනු ලැබුවේ මෙකී තත්වයයි. හුසල්ට අනුව භාෂාව අර්ථවත් වන්නේ උපරිම ලෙස මානව

[1] දර්ශන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, chathush1221@gmail.com

මැදිහත්වීමකින් යුක්ත වූ විටයි. නමුත් ඩෙරීඩාට අවශ්‍ය වන්නේ මානව පාලනයෙන් පරිබාහිරව භාෂාව ක්‍රියාකාරී වන බව අවධාරණය කිරීමටයි. මෙහිදී ඩෙරීඩා වැදගත් කොට සලකන්නේ කථන භාෂාව නොව ලේඛනයයි. ලේඛනය තවදුරටත් කිසිවකුගේ මානසික මැදහත්වීමකට භාජනය වූවක් නොව ඩෙරීඩාට අනුව එය යථාර්ථවත් ලෙස පවතින්නකි. අනෙක් අතට ඔහු ලේඛනය තුළින් ඉදිරිපත් වන සංඥාකාරකයන් පිළිබඳ අර්ථ දක්වනුයේ සාමාන්‍ය අර්ථයෙන් නොව ඔහුට අනුව සංඥාකාරකයෙහි ස්වභාවය එයින් පිට යමක් සමුද්දේශ (Pointing away from themselves) කිරීමයි. එවිට සංඥිතයක් ඇත්තේ නැත.මෙම පදනම මත ඩෙරීඩාගේ නිගමනය වන්නේ සංඥාකාරකය චලනයෙහි යෙදෙන බවයි. අර්ථයෙහි අර්ථය අනන්ත ගම්‍යයක (Meaning of meaning is an infinite implication) යෙදෙන බව ඩෙරීඩාගේ ආකල්පයයි. මෙය ඔහු හඳුන්වනු ලබන්නේ 'Dissemination' නමැති පාරිභාෂික පදයෙනි. ඔහුට අනුව ලේඛනයක අර්ථය නිරන්තර විසිරීමකට භාජනය වේ. ඔහු එය පැහැදිලි කරන එක් උදාහරණයක් වන්නේ ග්‍රීක වචනයක් වන 'Pharmakon 'යන්නයි. ප්ලේටෝ විසින් සිය 'Phaedrus 'නමැති සංවාදයේදී ලේඛනය සම්බන්ධව මෙම පදය භාවිත කරයි. නමුත් ඩෙරීඩාට අනුව මේ තුළ අර්ථ කිහිපයක් ගැබ්වේ. එක් අතකින් එය ඖෂධයක් ලෙස ගත හැකිය. නමුත් ඒ තුළ'විෂ' යන අර්ථයද ගැබ්වේ. මෙය කිසියම් වර්ණකයක්ද විය හැකිය. සුවඳ විලවුන් වර්ගයක්ද විය හැකිය. මේවා භාවිත කරනු ලබන්නේ නළුනිළියන්ය. ඒ ග්‍රීක යුගයේදී නම් උත්සව සඳහාය. මෙම 'Pharmakon 'යන්නෙහි ඉන්ද්‍රජාලික අර්ථයද ගැබ්වේ. එකල ඉන්ද්‍රජාල තහනම් විය. ඒවා භාවිත කළ අය නගරවලින් පිටුවහල් කරන ලදී. (Derrida; Barbara Johnson(tr);1981;70 -71) මෙලෙස සංඥාකාරකයන් අනෙකුත් සෑම සංඥාකාරකයකටම බලපාන බව ඩෙරීඩාගේ අදහසයි. මෙහිදී අර්ථ ඉතිරි යාමක් සිදුවේ. 'Dissemination' යනුවෙන් අදහස් වන්නේ භාෂාවේ මෙකී ව්‍යාකූල වීමේ ස්වභාවයයි. මේ අනුව මෙම තත්වයේදී භාෂාව මත බලපවත්නා මානව පාලනය අවසන් වන බව ඩෙරීඩාගේ අදහසයි. එහිදී භාෂාව අරාජික හා අනාවැකි කිව නොහැකි තත්වයකට පත්වේ. මෙයින් පැහැදිලි වන්නේ ඩෙරීඩා විසින් භාෂාවේ අර්ථය විචලනය වීම මානව පාලනයෙන් පරිබාහිරව සිදුවන්නක් බව අවධාරණය කරන බවයි. ඔහු විසංයෝජනවාදය(Deconstruction) නමැති භාෂා විශ්ලේෂණය හඳුන්වා දෙන්නේ මානව පාලනයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන භාෂාවට මිනිසා විසින් බාහිර වශයෙන් අර්ථය ලබාදීමට උත්සාහ කිරීම මැඩපැවැත්වීම උදෙසාය. ඒ අනුව විසංයෝජනය යනු ලේඛනයක අර්ථය විනාශ කිරීම නොව අර්ථය ලබාදීමට දරන උත්සාහය විනාශ කිරීමයි. නමුත් මෙහි ගැටලුව වන්නේ භාෂාව මනුෂ්‍ය පාලනයෙන් පරිබාහිරව නිදහසේ ක්‍රියාත්මක වන්නක්ය යන්න යුක්තිසාධනීය ලෙස පිළිගත හැකිද යන කාරණයයි.

ඩෙරීඩා අදහස් කරන පරිදි භාෂාවේ අර්ථය විසිරීම හුදෙක් භාෂාව ස්වාධීනව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයකි. නමුත් මෙහි ගැටලුව වන්නේ ක්‍රියාකාරී

ග්‍රාහකයෙකුගෙන් තොරව ක්‍රියාකාරී වන භාෂා සන්නිවේදනයක් පිළිගත හැකිද යන්නයි. ව්‍යුහවාදියෙකු ලෙස ෆර්ඩිනන්ඩ් සෝෂියර්ගේ භාෂා න්‍යාය විවේචනය වූ කරුණ ඩෙරීඩාටද අදාළ වන බව මින් පැහැදිලි වේ. කිසියම් වචනයකින් හැඟවෙන අර්ථය වටහාගන්නේ පුද්ගලයාමය. පුද්ගල මැදිහත්වීමකින් තොරව භාෂාවට අර්ථයක් ලැබේ යැයි පිළිගැනීම දුෂ්කර වූවකි. අනෙක් අතට භාෂාව පුද්ගලයා විසින් පරිණාමීය වශයෙන් දියුණු වත්ම සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් සම්මුතියෙන් ඇතිකරගත්තක් මිස පුද්ගලයාගෙන් වියුක්තව ප්‍රභවය වූවක් නොවේ. මේ අනුව හුසල්ගේ භෂා න්‍යාය විවේචනයේදී ඩෙරීඩා විසින් පුද්ගල විඥානයේ මැදිහත්වීමෙන් භාෂාව විනිර්මුක්ත කිරීමට දරන ලද උත්සාහය කිසියම් ආධානග්‍රාහී ස්වරූපයක් උසුලන බව පෙනේ. මේ සම්බන්ධව විමසා බැලීමේදී මුල්බුදුසමයේ එන මධුපිණ්ඩික සූත්‍රය මෙම විචාරය සඳහා ආධාර කරගත හැකිය. මධුපිණ්ඩික සූත්‍රයෙන් පැහැදිලි වන්නේ පුද්ගල ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලියයි. එහිදී ඩෙරීඩා ඉදිරිපත් කළ 'Dissemination' නමැති සංකල්පය සඳහා මධුපිණ්ඩික සූත්‍රයේ යෙදෙන 'ප්‍රපංච' යන පදය අදාළ කරගත හැකිය.

'ප්‍රපංච' යන පදය බොහෝවිට යෙදෙන්නේ මනෝවිද්‍යාත්මක සන්ධර්භය තුළය. ඉන්ද්‍රිය සංජානනයෙන් ආරම්භ වී එහි අවසානය ප්‍රපංචකරණය දක්වා විහිදෙන බව  මධුපිණ්ඩික සූත්‍රය තුළින් අදහස් වේ. ඇස කන ආදී ෂඩ් ඉන්ද්‍රියන් වෙත අරමුණු ගෝචර වීම නිසා හටගැනෙන ඒ ඒ විඥානයන්ගේ කෙළවර මෙකී ප්‍රපංචකරණයයි. එය ඉන්ද්‍රිය සංජානනය හරහා මානසිකව ඇතිවන ව්‍යාකුල ස්වභාවයකි. "ඇවැත්නි, ඇසත් රූපයත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තුනෙහි එක්වයාම ස්පර්ශයයි. ස්පර්ශය ප්‍රත්‍යයෙන් වේදනාව. යමක් විඳීද එය හඳුනාගනී. යමක් හඳුනාගනීද එය විතර්ක කරයි. යමක් විතර්ක කරයිද එය ප්‍රපංච කරයි. යමක් ප්‍රපංච කරයිද ඒ හේතුකොටගෙන පපඤ්චසඤ්ඤාසංඛාවෝ අතීත අනාගත වර්තමාන ඇසින් දත යුතු රූප පිළිබඳව ඒ පුරුෂයා මැඩපවත්වයි"(ම.නි. මධුපිණ්ඩික සූත්‍රයි) මෙසේ ෂඩ් ඉන්ද්‍රියයන් සම්බන්ධවම මෙම ක්‍රියාවලිය සිදුවන ආකාරය මධුපිණ්ඩික සූත්‍රයේ විග්‍රහ කොට තිබේ. මෙයින් පැහැදිලි වන්නේ කිසියම් අරමුණක් ඉන්ද්‍රියක් වෙත ගෝචර වීමෙන් එය ඉතා දීර්ඝ ක්‍රියාවලියක් වෙත යොමුවන බවයි. මෙහිදී ඩෙරීඩා විග්‍රහ කරන ලද උදාහරණයම සැලකිල්ලට ගතහොත් ප්ලේටෝ ලේඛනය 'Pharmakon' ලෙස හැඳින්වුවද එම වචනය එක්කෝ අපට ඇසුණු පමණින් නැතහොත් දුටු පමණින් එය මුලින්ම හඳුනාගන්නා අතර අනතුරුව ඒ පිළිබඳ විතර්ක කරයි. 'Pharmakon' යන වචනය වෙතදිය හැකි අර්ථ කිහිපයක් ඇති බව වටහාගන්නේ මෙම අවස්ථාවේදීය. පසුව එකී අර්ථ පිළිබඳව දිගින් දිගට කල්පනා කොට කිසියම් ව්‍යාකුල තත්වයකට පත්වීම ප්‍රපංචකරණයකි. ඩෙරීඩා 'Dissemination' ලෙස විග්‍රහ කොට ඇත්තේ මෙම ව්‍යාකුලත්වය යැයි තර්ක කළ හැකිය.

මෙම ප්‍රපංචකරණය වඩාත් පැහැදිලි වන කථාංගයක් ධම්මපදට්ඨකථාවේ භාගිනෙය්‍ය සංඝරක්ඛිත කථාවස්තුවෙහි සඳහන් වේ.ඒ අනුව අර්ථය ව්‍යාකුල වන තරමට භාෂාව දීර්ඝ ගමනක යෙදෙන්නේ පුද්ගල පාලනයෙන් පරිබාහිරවය යන්න

මුළුමනින්ම සදොස් ආකල්පයකි. එය සපුරාම පුද්ගල විඥානික ක්‍රියාවලියකි. එය කටුකුරුන්දේ ඤාණනන්ද හිමි විග්‍රහ කරන්නේ මෙසේය. "....'පපංච' යන පදය වඩා පුළුල් අරුතක් දනවමින් පුහුදුන් පුගුලාගේ කාල්පනික 'කුළුමීමා' ගාල කඩාගෙන දිව යන හැටි ඉඟි කරයි."(ඤාණානන්ද භික්ෂු;2016; 4) මින් නිරූපණය වන්නේ ප්‍රපංචකරණය කිසියම් නොවැළැක්විය හැකි ආකාරයකින් මෙන්ම ඉතා ව්‍යාකූල අයුරින් සිදුවන බවය. ඒ අනුව ප්‍රපංචකරණය යන්න ඩෙරීඩා ඉදිරිපත් කළ 'Dissemination' නමැති සංකල්පය ලෙසම ගත හැකිය. නමුත් ගැටලුව වන්නේ ඩෙරීඩා මෙය භාෂාවේ අනන්‍ය ලක්ෂණයක් ලෙස පිළිගැනීමයි. භාෂාව තුළ ප්‍රපංචකරණය ඇතිවන්නේ මිනිසාගේ ඉන්ද්‍රිය සංජානනයෙන් හටගන්නා මානසික ක්‍රියාවලියකින් මිස ඉන් බාහිරවය යන්න පිළිගැනීමට තරම් ශක්තිමත් සාධක ඩෙරීඩා විසින් ඉදිරිපත් කොට නොමැත. "මන්ත්‍රකරුවන් විසින් ව්‍යාඝ්‍ර ඇටකටු එකතු කොට යළි පණගන්වන ලද ජනප්‍රවාදගත ව්‍යාඝ්‍රයා මන්ත්‍රකරුවන් කා දැමුවාක් මෙන් සංකල්ප සහ භාෂා ව්‍යවහාර ඒවා නිපදවූ පුහුදුන් පුගුලා අභිභවනය කරයි." (ඤාණනන්ද භික්ෂු; 2016; 6) මෙම උදාහරණයෙන් තීව්‍ර ලෙස අවධාරණය වන්නේ භාෂාවේ අර්ථ ව්‍යවහාර නිපදවෙන්නේ මුළුමනින්ම මානව විඥානයේ මැදිහත්වීමෙන් බවයි.

## නිගමනය

ඒ අනුව අවසන් වශයෙන් නිගමනය කළ හැක්කේ භාෂාව මානව පාලනයෙන් පරිබාහිර ක්‍රියාවලියක්ය යන ඩෙරීඩියානු දෘෂ්ටිය දෝෂ සහගත වන බවය. එය මානවයාගේ භෞතික හෝ මානසික අරමුණකින් ආරම්භ වී විඥානයේ මැදිහත්වීම මත සිදුවන්නකි. එනම් ප්‍රපංචවේදී වේ. ඊට මුල් බුදුසමය සාක්ෂි දරයි.

ප්‍රමුඛ පදඃ භාෂාව, ප්‍රපංචකරණය, මානව පාලනයෙන් පරිබාහිර, අර්ථය

## ආශ්‍රිත ග්‍රන්ථ


මජ්ඣිම නිකාය, මධුපිණ්ඩික සූත්‍රය

Derrida. J.,*Dissemination.* Barbara Johnson(tr).(1981).London: The Athlone Press.

Derrida, J.*Speech and Phenomena:and Other Essays On Husserl's Theory of Signs*. David B. Allison and Newton Garver(tr.).(1973).Northwestern University Press.

ඤාණනන්ද භික්ෂු. (2016).*පැරණි බෞද්ධ චින්තාවේ සංකල්ප හා යථාර්ථය.* කරඳනඃ කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය.

Harland, Richard. (1987). *Superstructuralism: the Philosophy of Structuralism and Post-Structuralism.* London: Routledge.